**ඔපෙක් අරමුදලින් පුනරුත්ථාපනය හා වැඩි දියුණුවන කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය - 2014**

---

ඔපෙක් අරමුදලින් පුනරුත්ථාපනය හා වැඩි දියුණුවන කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 11 සිට 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල අතර 2013 ජූනි 10 දින එළඹි අංක 15111පීබී දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, එවකට මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රධාන මහාමාර්ග කිලෝමීටර 65.45 ක තත්ත්වය උසස් කිරීම හා නාරාහේන්පිට - නුගේගොඩ පාලම යළි ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,347.37 කට සමාන එ.ජ.ඩො. මිලියන 94.99 ක් වූ අතර එයින් රු. මිලියන 6,499.57 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කළ අතර 2017 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම්

තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** **මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**3.** **මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**-----------------------------------**

**3.1** **අරමුදල් උපයෝජනය**

**-----------------------**

මූල්‍යයනය, සමාලෝචිත ගිණුම් වර්ෂය තුළදී අයවැය ගත ප්‍රතිපාදනය සහ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය තුළදී අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල** | | **පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කළ වෙන්කිරීම** | **2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය** | |
|---|---|---|---|---|---|
| | **එ.ජ.ඩො. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **එ.ජ.ඩො. මිලියන** | **රු. මිලියන** |
| ඔපෙක්-ණය | 50.00 | 6,499.57 | 114.53 | 0.88 | 114.53 |
| ශ්‍රී.ලං.ර | 44.99 | 5,847.80 | 0.43 | - | 0.50 |
| | **94.99** | **12,347.37** | **114.96** | **0.88** | **115.03** |

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂිත කිලෝමීටර 65.45 ක දිග සහිත මාර්ග 12 ක් අතුරින් කිලෝමීටර 12.38 ක දිග සහිත මාර්ග 05 ක් ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් මාසයේදී කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් අනෙක් මාර්ග 07 හි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ කොන්ත්‍රාත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිරිනමා නොතිබුණි. තවද, කෝට්ටේ-බෝපේ මාර්ගයේ හා නාවින්න- බොරලැස්ගමුව මාර්ගයේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2013 පිරිනමන ලද එහෙත් 2014 දෙසැම්බර් 31 දිනට සියයට 75.07 ක අඩු ප්‍රගතියක් පෙන්නුම් කළ නාවල පාලමේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2015 අගෝස්තු 31 දින සම්පූර්ණ කර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

ව්‍යාපෘති ගණකාධිකාරි, ලේකම්වරයකු, පරිපාලන සහකාරවරයකු, ප්‍රවාහන පද්ධති විශ්ලේෂක හා නැවත පදිංචි කිරීමේ සහකාර තනතුරු වසර 01 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවතිව තිබුණු බවත් එය ව්‍යාපෘති කටයුතුවල අඛන්ඩ ක්‍රියාකාරීත්වයට බලපා තිබුණු බවත් නිරීක්ෂණය විය.